පාර්ලිමේන්තු ත්‍රස්තවාදය

ශ්‍රීලාල් ප්‍රියන්ත

ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ ප්‍රථම වතාවට පාර්ලිමේන්තුව එක දිගට දින තුනක් කල් දමමින් ඉතිහාසගත වාර්තාවක් තැබීමට කොටි සංවිධානයේ සෘජු නියෝජිතයින් ලෙස ක්‍රියා කරන දෙමළ ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සමත් වී ඇත.

ඒ 2006 වර්ෂය උදෙසා පාර්ලිමේන්තු සැසිවාරය ආරම්භවීමත් සමඟ ජනවාරි මස 17,18,19 යන දිනවල එම දෙමළ මන්ත්‍රීවරු පාර්ලිමේන්තු සභා ගර්භය තුළ අසංවර ලෙස හැසිරීම නිසා කථානායක වී.ජ.මු ලොකු බණ්ඩාර මහතාට පාර්ලිමේන්තුව මෙලෙස කල් දැමීමට සිදුවීමය.

මෙම දින තුන තුළ එක් දිනකට විනාඩි 10 බැගින් දින තුනේම උපරිම වශයෙන් පාර්ලිමේන්තුව පවත්වා ගෙන ගොස් ඇත්තේ විනාඩි 30 ක් වැනි ඉතාමත් සුළු කාල පරිච්ඡේදයකි.

මෙවැනි දෙයක් මීට පෙර ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ඉතිහාසය තුළ කිසිදු දිනයක සිදුවී නැත. සිදුනොවුණ දෙයක් සිදුකර සිය නාමය ඉතිහාස ගත කිරීමට තරම් කොටි සංවිධානයේ උරුමක්කාරයක් වශයෙන් පෙනී සිටින දෙමළ ජාතික සංවිධානයේ මන්ත්‍රීවරු 22 නා ක්‍රියාකර ඇත.

දෙමළ මන්ත්‍රීවරු පාර්ලිමේන්තුව තුළ කෑකෝ ගසමින් මොන තරම් අශෝභන ලෙස හැසිරුණාද! කිවහොත්, යාපනය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.කේ. සිවාජිලිංගම් මහතා කථානායකවරයාගේ පුටුවේ පවා බලහත්කාරයෙන් වාඩි වී යටි ගිරියෙන් කෑගැසුවේ පාර්ලිමේන්තුවේ මහජන ගැලරියේ සිටි බොහෝ දෙනාව විශ්මයට පත් කරවමිනි.

එපමණක් නොව, එම්.කේ. සිවාජිලිංගම් මන්ත්‍රීවරයාව අනුගමනය කරමින් දෙමළ ජාතික මන්ත්‍රී සුරේෂ් ප්‍රේමචන්ද්‍ර මහතා පාර්ලිමේන්තු මහ ලේකම් ප්‍රියානි විජේසේකර මහත්මියගේ පුටුවේ වාඩිවෙමින් පාර්ලිමේන්තු සම්ප්‍රදාය සහ ගෞරවය කෙළෙසමින් කළහකාරී ලෙස හැසිරෙන්නට විය.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව එක දිගට දින තුනක් කල්දමා පමණක් නොව, ලංකාවේ උත්තරීතරම ආයතනය ලෙස සැළකෙන පාර්ලිමේන්තුවේ උත්තරීතරම ආසනය වන කථානායක පුටුවේ ත්‍රස්තවාදී සංවිධානයක නියෝජිතයෙකු වාඩි වී තිරිසන් විදියට හැසිරෙමින් එම පුටුවේ පමණක් නොව, පාර්ලිමේන්තුවේ පවා ගෞරවය හා පාරිශුද්ධ භාවය හෑල්ලුවට ලක් කළහ.

දෙමළ මන්ත්‍රීවරුන් කරන කඩා කප්පල්කාරී ක්‍රියා නතර කරමින් පාර්ලිමේන්තුව දින තුනේම සාමකාමීව පවත්වා ගෙන යෑමට කථානායක වී.ජ.මු. ලොකුබණ්ඩාර මහතා විශාල උත්සාහයක් ගත්තේය. එහෙත් එය සාර්ථක වූයේ නැත.

ඔවුන් දිගින් දිගටම ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරෙන්නට වූහ. ඔවුන්ගේ එම අයහපත් තත්ත්වය දෙස බලා සිටි කථානායකවරයා ''මෙන්න මෙතනනේ නියම ත්‍රස්තවාදය තියෙන්නේ'' යනුවෙන් වරක් අත දිගු කර ප්‍රකාශ කර සිටියේය.

නමුත් කථානායක වරයා එලෙස ප්‍රකාශ කළාට එම ත්‍රස්තවාදය නතර කිරීමට උත්සාහ කළේ නැත. පාර්ලිමේන්තුවේ ඉහළ ආසනයේ වැජඹෙන විනිසුරුවරයා වන කථානායකවරයා සිය බලතල නිසිලෙස යොදා ගෙන එම පාර්ලිමේන්තු ත්‍රස්තවාදය මර්දනය කිරීමට විධිමත් පියවරක් නොගැනීම බලවත් වරදකි.

කථානායකවරයාගේ මූලික යුතුකම හා වගකීම වන්නේ පාර්ලිමේන්තුවේ ගෞරවය සුරැකෙන ආකාරයට එය උපරිම වශයෙන් විනීතව පාලනය කරගෙන සිය වැඩ කටයුතු බාධාවකින් තොරව පවත්වා ගෙන යෑමට අවශ්‍ය වටපිටාව නිර්මාණය කිරීමය.

නමුත් වී.ජ.මු. ලොකු බණ්ඩාර මහතා එම කාර්ය සිදුකර නැත. ඔහුට නියමාකාරයට පාර්ලිමේන්තුව පවත්වා ගෙන යෑමට අපහසු නම් පවත්වා ගෙන යෑමට පුළුවන් අයෙකුට ඉඩදී සිය ධූරයෙන් ඉවත්වී යායුතුය. එහෙත් එවැනි දෙයක් පෙනෙන්නත් නැත. මොන ප්‍රශ්න ඇති වුණත්, තමන්ට සිය කාර්ය කරන්නට බැරි වුණත්, ඔහු සිය තනතුරේ රැඳී සිටීමට විශාල ප්‍රයත්නයක් දරන බවක් පෙනේ.

දෙමළ මන්ත්‍රීවරු කොටින්ගේ රූකඩ ලෙස ක්‍රියා කරමින් පාර්ලිමේන්තුව තුළ ත්‍රස්තවාදය පතුරවන්නේ නම්, ඔවුන්ව ඉන් ඉවත් කළ යුතුය. නැත්නම් කිසියම් කලකට පාර්ලිමේන්තුවට පැමිණීම තහනම් කළ යුතුය. එහෙමත් නැත්නම් ඔවුන්ගේ පාර්ලිමේන්තු ත්‍රස්තවාදය අහෝසි කිරීම උදෙසා වෙනත් විකල්පිය ක්‍රියා මාර්ගයක් ගත යුතුය.

දැන් මේ කිසිම දෙයක් නැත. දෙමළ මන්ත්‍රීවරු පාර්ලිමේන්තුව තනිකරම කෝළම් මඩුවක් කර ඇත. අංගොඩ පිස්සන් කොටුවටත් එහා ගිය පිස්සන් කොටුවක් බවට පාර්ලිමේන්තුව පත්කර ඇත. මෙය ඉතාමත් ඛේදනීය ස්වභාවයකි.

කොටි සංවිධානය සෘජු ලෙසම නියෝජනය කරන මෙම දෙමළ මන්ත්‍රීවරුන්ගේ ත්‍රස්තවාදී ක්‍රියාකාරීත්වය පාර්ලිමේන්තුවට පමණක් නොව, රටටද මහත් අනතුරු විපත් ගෙන දෙන සිද්ධියක් වීමට බැරි නැත.

කිසියම් අවස්ථාවක මෙම එක් දෙමළ මන්ත්‍රීවරයෙක් හෝ ඊට වැඩි පිරිසක් කොටින්ගේ අවශ්‍යතාවට බෝම්බ රැගෙනවිත් පාර්ලිමේන්තු සභා ගර්භය තුළ පුපුරුවා හැර සිය දිවි නසා ගතහොත් ඇතිවන තත්ත්වය කුමක්ද! එසේ නොවේයැයි යන්නට දියහැකි සහතිකය කුමක්ද! යන්න මතුවන ප්‍රශ්නයකි

ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට සිය පාර්ලිමේන්තු වරප්‍රසාද වලට මුවාවී බෝම්බ පමණක් නොව, භයානක ගණයේ ගිනි අවි පවා පරීක්ෂාවකින් තොරව පාර්ලිමේන්තුවට ගෙනයා හැක. පසුගිය යුගයේ පාර්ලිමේන්තු සභා ගැබට මිනී පෙට්ටි ගෙන ආ හැටි අප කාටත් අමතක නැත. එලෙස මෙම මන්ත්‍රීවරුන් නොකරයි කියා කිවහැක්කේ කෙසේද!

එබැවින් වගකිවයුතු අංශ මේ පිළිබඳ සිය අවධානය යොමුකර සිහි බුද්ධියෙන් යුතුව ක්‍රියා කළ යුතුව ඇත. එසේ නොවුණහොත්, සිදුවන විනාශය අපමණය. මෙම කොටි නියෝජිතයින්ව පවතින නීති මගින් මර්දනය කළ නොහැකි නම්, අලුතින් නීති ඇති කර හෝ මර්දනය කළාට වරදක් නැත.

ත්‍රස්තවාදයට ප්‍රජාතන්ත්‍රවාදයෙන් විසඳුම් දී නිසි පල ප්‍රයෝජන භුක්ති විඳීමට අපහසු නම්, ත්‍රස්තවාදයට ත්‍රස්තවාදයෙන් හෝ පිළිතුරු සපයා බහුතර දෙනාගේ සුබ සිද්ධියට මංපෙත් විවර කිරීමත් ප්‍රජාතන්ත්‍රවාදයට අනුකූලවනවා ඇත.

එබැවින් මෙම දෙමළ මන්ත්‍රීවරුන්ගේ ත්‍රස්ත ක්‍රියා පාර්ලිමේන්තු නීති මගින් අහෝසි කිරීමට අපහසු නම්, කරුණා පාර්ශවයේ හෝ නාඳුනන තුවක්කු කරුවන් පිරිසකගේ සහය මතින් හෝ විකල්පීය විසඳුමක් කරා ගමන් කළාට එතරම් බරපතල වරදක් නොවේ.

මෙම දෙමළ ජාතික මන්ත්‍රීවරුන් 22 නා පසුගිය ජනවාරි මස 17,18,19 යන දින තුනේ පාර්ලිමේන්තුව තුළ සිය ත්‍රස්ත ජාලය විහිදුවමින් කළහකාරී ලෙස හැසිරුණේ කුමන කරුණක් නිසාද!

ඒ වෙන කිසිවක් නිසා නොව, දෙමළ ජාතික සන්ධානයේ මඩකලපුව දිස්ත්‍රික් මන්ත්‍රී ජෝශප් පරරාජසිංහම් මහතාගේ ඝාතනයට විරෝධය පළ කිරීම උදෙසාය.

කොටි සංවිධානයත්, දෙමළ සන්ධානයත් ප්‍රකාශ කරන්නේ මෙය, ආණ්ඩුව කරුණා පාර්ශ්වයේ සහ ඊ.පී.ඩී.පී. සංවිධානයේ සහයෝගය ඇතිව කරන ලද ඝාතනයක් බවය.

නමුත් ආණ්ඩුව මෙය සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරයි. ආණ්ඩුව එම ඝාතනයේ ඇඟිල්ල දිගු කරන්නේ කොටි සංවිධානය වෙතමය. කොටින්ගේ ඇතැම් කාරණා වලට පරරාජසිංහම් මන්ත්‍රීවරයා එකඟ නොවූ බැවින් ඔහුව කොටි විසින්ම ඝාතනය කර ඇති බව ආණ්ඩුවේ චෝදනාව වෙයි.

කෙසේ වෙතත්, මෙම ඝාතනය කොටින්ගේ ක්‍රියාවක් බවට සැක කිරීමට තිබෙන සාධක ඉතාම අවමය. ඊටත්, පරරාජසිංහම් මන්ත්‍රීවරයාව කොටි මැරුවා නම්, ඔහු මියගිය පසු කොටි ''මහා පුරුෂයා'' සම්මානයෙන් පිදුම් ලබන්නේ නැත.

අවමංගල්‍ය උත්සවයට උපරිම වශයෙන් පූර්ණ සහයෝගය ලබාදී දේහයට කොටි උත්තමාචාර දක්වන්නේ නැත. ඉන් පැහැදිලි වන්නේ මෙය කොටි සිදුකළ දෙයක් නොව, කොටින්ගේ පිටින් යෑම උදෙසා වෙනත් පාර්ශ්වයක් සිදුකළ දෙයක් බවය.

මෙම ඝාතනය ඉලක්ක කරගෙන දෙමළ මන්ත්‍රීවරු මෙතරම් අශෝභන, කළහකාරී ලෙස හැසිරී පාර්ලිමේන්තුවේ වැඩ කටයුතුවලට අවහිර කරන්නේ ඇයි! ඉන් පැහැදිලි වන දෙයක් නම්, මෙතෙක් කලක් කොටි සිය ප්‍රචණ්ඩකාරී ක්‍රියා කලාපය මුදාහැරියේ උතුරු නැගෙනහිර පළාත ඉලක්ක කරගෙන දිවයිනේ විවිධ ස්ථානවලය.

නමුත් දැන් ඔවුන් සිය දෙමළ ජාතික කොටි මන්ත්‍රීවරුන්ගේ මාර්ගයෙන් පාර්ලිමේන්තුව තුළත්, ප්‍රචණ්ඩකාරී ක්‍රියා ඇති කිරීමට පටන් ගෙන ඇත.

කොටින්ට මෙතෙක් කලක් පාර්ලිමේන්තුව තුළ තම අභිමතය පරිදි විනාශකාරී ක්‍රියා ඇති කිරීමේ හැකියාවක් තිබුණේ නැත. දැන් එයත් උදාකර ගැනීමෙන් රටේ ආරක්ෂාවේ අනතුරුදායක ස්වභාවය කෙතෙක්ද! යන්න ඕනෑම අයෙකුට පැහැදිලි වනවා ඇත.

සිංහල, දෙමළ, මුස්ලිම් පමණක් නොව, ඕනෑම ජාතියකට අයත් පුද්ගලයෙක් ඝාතනය වුවහොත්, එම පිළිබඳ නිසි පරීක්ෂණයක් පවත්වා ඝාතකයන් අත් අඩංගුවට ගැනීමට පොලීසිය ක්‍රියා නොකරන්නේ නම්, ඊට එරෙහිව සාමකාමීව විරෝධතා ව්‍යාපාරයන් දියත් කිරීමේ වරදක් නැත.

නමුත් එම විරෝධය සියල්ල විනාශ මුඛය කරා යන ප්‍රචණ්ඩ ත්‍රස්තවාදී ක්‍රියා නොවිය යුතුය. ඒත් දෙමළ මන්ත්‍රීවරුන්ගේ විරෝධය පිටු පස ඇත්තේ සැබෑ ජනතා අවශ්‍යතා නොව, පටු ත්‍රස්තවාදී අවශ්‍යතාය. ඒවාට ඉඩදිය හැකිද!

එපමණක් නොව, දෙමළ ජාතික මන්ත්‍රීවරයෙකු වූ ජෝශප් පරරාජසිංහම් මහතාගේ ඝාතනයට විරෝධය පා අද දෙමළ මන්ත්‍රීවරු මහ ලොකුවට පාර්ලිමේන්තුව බිමට පෙරළන්නට කෑකෝ ගසමින් හැසිරෙන්න පටන් ගෙන ඇත.

නමුත් දෙමළ ජාතිකයෙකු වූ හිටපු විදේශ කටයුතු අමාත්‍ය ලක්ෂ්මන් කදිරගාමර් මහතාව කොටි ඝාතනය කළ මොහොතේ ඊට විරෝධය පා මෙම මන්ත්‍රීවරු පාර්ලිමේන්තුව තුළ හෝ ඉන් පිට කළේ මොනවාද! පිකටිං කළාද! වැඩ වර්ජන කළාද! උද්ඝෝෂණ කළාද! හෙළා දැකීමේ නිවේදන නිකුත් කළාද! එහෙමත් නැත්නම්, වෙනයම් දෙයක් කළාද! නැත. කිසිම දෙයක් කළේ නැත.

එමගින් දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරුන්ගේ කොටි පුල්ලිවල සැබෑ ගති ලක්ෂණ පෙන්නුම් කරනු ඇත. පරරාජසිංහම් මන්ත්‍රීවරයාත් දෙමළ ජාතිකයෙකි. කදිරගාමර් මන්ත්‍රීවරයාත් දෙමළ ජාතිකයෙකි.

එසේනම් මේ දෙදෙනාගේ ඝාතන සම්බන්ධයෙන් එක ආකාරයට සළකා ක්‍රියා කරනු වෙනුවට දෙවිදියකට සළකන්න තරම් දෙමළ ජාතික මන්ත්‍රීවරු අවස්ථාවාදී කුහක ගති ලක්ෂණ පෙන්නුම් කළේ කුමන පරමාර්ථයෙන්ද! ඒ වෙන කිසිවක් නොව, කොටි ත්‍රස්තවාදයේ අවශ්‍යතා ඉටු කිරීමකි.

හිටපු විදේශ කටයුතු අමාත්‍ය ලක්ෂ්මන් කදිරගාමර් මහතාව මරා දැම්මේ කොටි විසිනි. එබැවින් දෙමළ මන්ත්‍රීවරුන්ට ඊට විරෝධය පෑමේ හැකියාවක් නැත. එසේ වුවහොත්, සිදුවන්නේ විරෝධය දක්වන දෙමළ මන්ත්‍රීවරයාට කොටි උණ්ඩයට යටත්වී පරලොව යන්නටය.

නමුත් පරරාජසිංහම් මරා දැමීම සිදුවුණේ ආණ්ඩු පාර්ශ්වයෙනි. එබැවින් ''කන්න ඕනෑවූ විට කබර ගොයත් තලගොයා කීවාසේ'' න්‍යාය අකුරට පිළිපදමින් දෙමළ මන්ත්‍රීවරු කොටි අවශ්‍යතාවට පාද තබමින් ආණ්ඩුවට එරෙහිව අවි ඔසවන්නට වූහ.

උතුරු නැගෙනහිර පළාතේ අධි ආරක්ෂිත කලාප ඉවත් කරන ලෙස ඉල්ලා මෙම මන්ත්‍රීවරු උද්ඝෝෂණය කරති. කොළඹ සිදු කරන කොටි ඇල්ලීමේ මෙහෙයුම් නතර කරන ලෙස ඉල්ලා විරෝධය පළ කරති.

මේ ආකාරයට මෙම දෙමළ මන්ත්‍රීවරු කොටි සංවිධානයේ අවශ්‍යතාවයට අනුව යමින් ආණ්ඩුවට එරෙහිව දැඩි පියවර ගැනීමට යයි. මේ පිටුපස විදේශ රටවලින් යැපෙන එන්.ජී.ඕ හෙවත් රාජ්‍ය නොවන සංවිධානද විශාල සංඛ්‍යාවක් සිටී.

එපමණක් නොව, නව සම සමාජ පක්ෂයේ නායක ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න, එක්සත් සමාජවාදී පක්ෂයේ නායක සිරිතුංග ජයසූරිය, නව වාමාශික පෙරමුණේ නායක වාසුදේව නානායක්කාර, නීතිඥ නිමල් ප්‍රනාන්දු ඇතුළු ඒජන්තයන් පිරිසක්ද අද කොටින්ගේ වෙඩි නොවදින ඇඳුම් බවට පත්වී ඇත.

ඔවුන් පසුගිය දිනවල කොළඹ ඇතුළු ඊට තදාසන්න ප්‍රදේශවල විරෝධතා ව්‍යාපාර දියත් කරමින් ප්‍රකාශ කර සිටියේ කොළඹ කොටි ඇල්ලීමේ මෙහෙයුම් නතර කරන ලෙසය.

නමුත් මේ දෙමළ ජාතික මන්ත්‍රීවරු හෝ රාජ්‍ය නොවන සංවිධාන හෝ මුට්ටි කාසි පක්ෂවල නායකයන් හෝ උතුරු නැගෙනහිර පළාතේ කොටි කරන ප්‍රචණ්ඩ වැඩවලට එරෙහිව එක වචනයක් කතා කළාද! නිවේදනයක් නිකුත් කළාද! නැත.

යුද හමුදා රහස් තොරතුරු අංශයේ අණදෙන

කෑමට පසු.....

අසද්කදකොරොස් ලියයි


බොරුවට බදා ගන්නට වැඩක් නැහැ හද පතුලෙන් දෙන්න ඕනෙ කට්ටිය මූණට හොඳ කියලා පස්සේ පලු අරිනවා
අන්න හරි විවේචනයක් කළාම ඒක පිළිගන්න ඕනෙ ඇරගන්න යන්නෙ නැතුව ඒ හින්දා තමයි සිංහයෝත් බලු වෙන්නෙ
මැච් දිනනකොට හොඳයි පරදිනකොට නරකයි මොනවද මේ කතා
නෑ නෑ නෑ අපි ඔක්කොම කැමතියි දිනනවට පිළිගන්නෙ නැද්ද ටීම් එකේ ප්‍රශ්න තියෙනවා කියලා?
කමන්ට්‍රිය දෙන ඉයන් හීලියි මාක් ටේලරුයි ටෝනි ග්‍රෙගුයි ඔය කියන්නෙ හොඳට පොලිටික්ස් පොලිටික්ස්
ඇයි පරදින්නෙ? අපේ වැරැද්ද හින්දා ඇඩිලේඩ් මැච් එක දිනපු වෙලාව කට්ටිය බදාගෙන හිටියා වගේ හැමදාම ඉන්නවා නම් හරි
මැච් පැරදුනාට නම් කමක් නැහැ ඒක මැච් එකක් හරි මුන්ට ගහලා දිනලා
අපේ මොනාවද පොලිටික්ස් නැත්තෙ? ක්‍රීඩාවට ප්‍රවාහනයට හමුදාවට මහාමාර්ගෙට සුනාමියට පොලිටික්ස් පොලිටික්ස් රටට ආදරය කරන කට්ටියක් පාලකයො වුණ දාට මේ ඔක්කොම ප්‍රශ්න විසඳෙයි නැත්නම් අපේ කමන්ට්‍රිය වගේ වෙන රටවල් වල ඉඳගෙන ලංකාව හදයි
මැච් එක දෙක හිමිහිට දිනනා අස්සේ
කට්ටිය සෙට් වුණා අපෙ කෑමට පස්සේ